000123

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2015/2016

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 ජුනි/ ජූලි)

## BLE 207 (b) - පිරිවැයකරණය සහ විගණනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) කාලය පැය තුනයි. (03)

(3) ගණක යන්ත්‍ර භාවිත කළ හැක.

(4) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (අ) භාණ්ඩ හෝ සේවා නිෂ්පාදන ආයතනයකට පිරිවැය ගිණුම්කරණය ආශ්‍රයෙන් සැපයෙන තොරතුරු කුමන ආකාරයෙන් වැදගත් වන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සුරංජිත් සමාගමේ පිරිවැය වාර්තා ආශ්‍රයෙන් පහත දැක්වෙන තොරතුරු සාරංශ කර ඇත.

තොග වටිනාකම් :

| | | | |
|---|---|---|---|
| අමුද්‍රව්‍ය තොගය | - | 1/4/2017 | 85,000 |
| අමුද්‍රව්‍ය තොගය | - | 31/3/2018 | 93,500 |
| නොනිමි වැඩ තොගය | - | 1/4/2017 | 31,200 |
| නොනිමි වැඩ තොගය | - | 31/3/2018 | 27,800 |
| නිමි තොගය | - | 1/4/2017 | 52,600 |
| නිමි තොගය | - | 31/3/2018 | 43,100 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | - | | 79,300 |
| ඍජු වැටුප් | | | 56,400 |
| වෙනත් ඍජු වියදම් | | | 4,250 |
| කම්හල් කුලී සහ වරිපනම් | | | 6,000 |
| කම්හල් විදුලිබලය | | | 21,650 |
| කම්හල් යන්ත්‍රසූත්‍රක්ෂය වීම් | | | 18,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම් ප්‍රවාහන වියදම් | | | 3,800 |
| ප්‍රචාරණ වියදම් | | | 5,100 |
| බෙදාහැරීමේ ප්‍රවාහන වියදම් | | | 2,750 |
| කාර්යාල සේවක වැටුප් | | | 16,800 |
| කාර්යාල වියදම් | | | 7,200 |
| විකුණුම් සේවක වැටුප් සහ දීමනා | | | 17,350 |
| නොමිලේ බෙදාදුන් සාම්පල් පිරිවැය | | | 1,800 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් : ප්‍රාථමික පිරිවැය, කම්හල් පිරිවැය, නිෂ්පාදන පිරිවැය වෙන වෙනම දැක්වෙන අයුරින් පිරිවැය පත්‍රයක් පිළියෙල කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. (අ) ඕනෑම නිෂ්පාදන ආයතනයක් සිය ආයතනය තුළ රඳවාගන්නා තොග පිළිබඳව මනා පාලනයක් පවත්වා ගැනීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න

(ලකුණු 10)

(ආ) මුතුමාල සමාගමේ පිරිවැය වාර්තා ආශ්‍රයෙන් පහත දැක්වෙන පොදුකාර්ය පිරිවැය තොරතුරු සාරාංශ කොට ඇත.

| | | |
|---|---|---|
| කම්හල් බදුකුලී සහ වරිපනම් | රු. | 12,000 |
| කම්හල් විදුලිබලය | | 16,000 |
| වක්‍ර වේතන | | 6,200 |
| යන්ත්‍ර ක්ෂයවීම් | | 18,000 |
| කම්හල් සේවක සුභසාධන වියදම් | | 7,800 |

මෙම ආයතනය තුළ A, B සහ Cනම් නිෂ්පාදන අංශ 3ක් ද, X සහYනම් සේවා අංශ 2ක්ද ක්‍රියාත්මක වන අතර, එම එකිනෙක අංශයට අදාළ වෙනත් තොරතුරු පහත පරිදි සාරංශ කොට ඇත.

| | දෙපාර්තමේන්තු | | | | |
|---|---|---|---|---|---|
| | A | B | C | X | Y |
| භූමි ප්‍රමාණය වර්ග අඩි | 500 | 250 | 500 | 250 | 500 |
| යන්ත්‍ර වටිනාකම (රුපි.'000) | 20 | 40 | 20 | 5 | 5 |
| යන්ත්‍ර අශ්ව බලය | 50 | 40 | 20 | 10 | 10 |
| ඍජු වේතන (රුපි.) | 6,000 | 4,000 | 6,000 | 3,000 | 1,000 |
| වැඩකල යන්ත්‍ර පැය | 4,670 | 3,020 | 3,050 | ....... | ......... |

සේවා දෙපාර්තමේන්තු X සහYපහත පරිදි සිය සේවාවන් අනෙකුත් දෙපාර්තමේන්තු වලට සපයනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

| | A | B | C | X | Y |
|---|---|---|---|---|---|
| සේවා දෙපාර්තමේන්තු X | 40% | 30% | 20% | ........ | 10% |
| සේවා දෙපාර්තමේන්තු Y | 30% | 30% | 20% | 20% | ......... |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් :

i. නිෂ්පාදන දෙපාර්තමේන්තු A, B සහ Cවල මුළු පොදුකාර්යය පිරිවැයද (සේවා දෙපාර්තමේන්තු පිරිවැයද ඇතුලුව)

ii. එකිනෙක නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර භායන අන්තර්ග්‍රහණ අනුපාතයක්ද ගනන් බලන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**03.** (අ) සුපිරි නිෂ්පාදන ක්‍රියාවලි තුනක් අවසානයේ නිමි බවට පත්වේ. ඉන් පළමු ක්‍රියාවලියට අදාල තොරතුරු පහත පරිදි සාරංශ කොට ඇත. අමුද්‍රව්‍ය කිලෝ 1 ක් රු. 30/= බැගින් අමුද්‍රව්‍ය කිලෝ 1000 ක්‍රියාවලිය ආරම්භයේ යොදවා ඇත. මීට අමතරව මෙම ක්‍රියාවලියේ වැටුප් ලෙස රු. 6,000 සහ පොදු කාර්ය පිරිවැය ලෙස රු. 3,000/= දරා ඇත. ක්‍රියාවලියේ ආරක්ෂිත හානිය ඒකක 100කි. මෙම හානිය කිලෝවක් රු. 5/= බැගින් සුන්බුන් ලෙස විකුණා මුදල් ලබා ගෙන ඇත. ක්‍රියාවලියේ සත්‍ය නිෂ්පාදනය ඒකක 840 කි. පළමු ක්‍රියාවලි ගිණුම පිළියෙළ කරන්න.

**(ලකුණු 10)**

(ආ) සීමිත කැලණි මගී ප්‍රවාහන සමාගම කොළඹ සිට හලාවත දක්වා මගී බස්රථ පහක් (05) ධාවනයේ යොදවා ඇත. බස්රථයක මගී ආසන සංඛ්‍යාව 50වන අතර සාමාන්‍ය මගී ප්‍රවාහන ධාරිතාව ඉන් 80% පමණ වේ. සෑම බස් රථයක්ම දිනකට ගමන් වාර 2 බැගින් මසක් තුළ දින 25 ධාවනයේ යොදවා ඇත. 2018 ජුනි මාසයට අදාලව සාරාංශ කර ඇති ධාවන පිරිවැයේ තොරතුරු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| රියදුරු සහ සහායක වේතන | රු. | 240,000 |
| කාර්යාල සේවක වැටුප් | | 50,000 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | | 470,000 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | | 38,000 |
| රක්ෂණ හා බස්රථ ගාල් කිරීමේ වියදම් | | 76,000 |
| ක්ෂයවීම් (මාසයට අදාල) | | 260,000 |
| බැංකු ණය මත පොළී ගෙවීම් | | 80,000 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් මගී කිලෝමීටරයක ධාවන පිරිවැය ගණන් බලන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**04.** (අ) "ඔබ පදිංචි ප්‍රදේශයේ සුභසාධක සංගමයේ භාණ්ඩාගාරික තනතුර ඔබගේ වැඩිමහල් සහෝදරයා දරන්නේ යැයිද, එහි වාර්ෂික ගිණුම් විගණනය කරවා ගැනීම සඳහා ඔබගේ නම මහසභා රැස්වීමේදී යෝජනාවී ඇතිබවද උපකල්පනය කරන්න."

මෙම විගණනය ඔබට භාරගත හැකිද යන්න විගණකයේ සුදුසුකම්, නුසුදුසුකම් හා ස්වාධීනත්වය යන කරුණු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) "ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයේ වාර්ෂික ගණුදෙනු විගණනය කරවා ගැනීමට ඔබ අදහස් කළද, එය අනවශ්‍ය මුදල් නාස්තියක් ලෙස ඔබගේ කාලත්‍රයා ප්‍රකාශ කරයි."

විගණනයකින් අත්කරගත හැකි වාසි ආශ්‍රයෙන් විගණනයේ ඇති වැදගත්කම ඔහුට/ ඇයට පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඇ) විගණකයෙකු ලෙස පත්වීමක් ලැබුවෙකුගේ අයිතිවාසිකම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

**05.** (අ) මනාලෙස සංවිධානය වූ අභ්‍යන්තර පාලන ක්‍රමයක, අභ්‍යන්තර වාර්තාවක හා අභ්‍යන්තර විගණන ක්‍රමයක ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) ආයතනයක ක්‍රියාත්මක වන ව්‍යාපාර කටයුතු පොදු වශයෙන් පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි අභ්‍යන්තර පාලන ප්‍රශ්ණාවලියක ඇතුලත්විය යුතු ප්‍රධාන කරුණු කවරේද?

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**06.** (අ) ගණුදෙනු සමනිරීක්ෂණය සඳහා විගණකව යොදාගත හැකි විවිධ සමනිරීක්ෂණ ක්‍රම කවරේද?

**(ලකුණු 05)**

(ආ) ණයට විකුණුම් ගණුදෙනුවක් සමනිරීක්ෂණය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ඇ) වත්කම් සහ වගකීම් සත්‍යාපනය කිරීමේදී විගණක අවධානය යොමුකළ යුතු ප්‍රධාන අංශ කවරේද?

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

**07.** (අ) ශේෂපත්‍රයක දැක්වෙන මතු සඳහන් අයිතමයන් සත්‍යාපනය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

i. බද්ධ දේපල
ii. වෙළඳණය ගැතියෝ
iii. දිගුකාලීන ණය
iv. බැංකු අයිරාව

**(ලකුණු 12)**

(ආ) "ක්‍රමානුකූලව විගණන කටයුතු කරගෙන යාම සඳහා විගණනය සැලසුම් කිරීම වැදගත්වුවද, එවැනි විගණන වැඩසටහන් නිසා විගණන සහායකයින් අපහසුතාවන්ට පත්වන අවස්ථාද ඇත."

විගණන වැඩසටහනක වාසි සහ අවාසි දක්වමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

******************